විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2013

මගේ අංකය: විවැ/චක්‍රලේඛ/2013
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2013- 12- 3

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම් වරුන්,

**<u>නොගෙවූ විශ්‍රාම පාරිතෝෂික මුදල්/මාසික විශ්‍රාම වැටුප් මුදල් ගෙන්වා ගැනීම</u>**

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා විශ්‍රාමික නිලධාරියා/නිලධාරිනිය වෙත ගෙවනු ලබන විශ්‍රාම පාරිතෝෂික මුදල මෙම දෙපාර්තමේන්තුව විසින් යොමු කරනු ලබන්නේ ඔහු/ඇය අවසන් වරට සේවය කරනු ලැබූ ආයතනය වෙතටය.

02. මෙසේ යොමු කරනු ලැබූ චෙක්පත් විවිධ හේතූන් මත ආයතනයේ තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබෙන අවස්ථා වාර්තා වී ඇත. ඇතැම් අවස්ථාවල මෙම චෙක්පත් දීර්ඝ කාලයක් ආයතනයේ රඳවා තබාගෙන දින දීර්ඝ කිරීමට යොමුවන අවස්ථා ද ඇත. මෙසේ කුමන හේතුවක් මත හෝ රඳවා තබා ගන්නා ලද මුදල 2013.12.31 දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියන ලද චෙක්පතක් මඟින් එවීමට කටයුතු කළයුතු අතර මෙම චෙක්පත් යොමු කිරීමේදී චෙක්පතෙහි වටිනාකමට අදාලව විශ්‍රාමික තොරතුරු ඇතුළත් ලේඛණයක් ද ඉදිරිපත් කළ යුතුය.

03. එමෙන්ම, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත රඳවා තබා ගෙන ඇති නොගෙවූ මාසික විශ්‍රාම වැටුප් මගේ 2011.06.14 දිනැති චක්‍රලේඛ ලිපි අංක 02 හි උපදෙස් පරිදි වහාම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් නමින් චෙක්පතක් ලියා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන මෙන්ද තවදුරටත් දන්වා සිටිමි.

එස්.ඒ.සී. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : විගණකාධිපති